සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2022 ජූලි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

2022-08-28
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
    (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
    (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
    (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
    (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
    (5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
    (6) *ලකුණු 100 යි.*

---

## A කොටස

## වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 සමාගමක කොටස් හෝ ණයකර මිලදී ගැනීම සඳහා සහභාගිවන මෙන් මහජනතාව වෙත ආරාධනා කරනු ලබන ලියවිල්ල වන්නේ:

(1) කොටස් සහතිකයයි.
(2) සංස්ථා ප්‍රකාශයයි.
(3) කොටස් බලපත්‍රයයි.
(4) සංස්ථාපන සහතිකයයි.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, M7 වර්ගීකරණයට ඇතුළත් **නොවන** ව්‍යාපාරික සම්පතක් වන්නේ කුමක් ද?

(1) මිනිසුන් (Men).
(2) ශිල්ප ක්‍රම (Methods).
(3) කාලය (Minutes).
(4) මතකය (Memory).

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, සඵලදායි සන්නිවේදන ක්‍රමයක ඇති ගුණාංගයක් (quality) වන්නේ කුමක් ද?

(1) පූර්ණ බව.
(2) වේගවත් බව.
(3) ආචාරශීලීභාවය.
(4) ඉහත සඳහන් සියල්ලම.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරිකයෙකුට රක්ෂණය කළ හැකි අවදානමක් (risk) වන්නේ කුමක් ද?

(1) අනාගත මූල්‍ය වර්ෂවල සිදුවන ව්‍යාපාරික අලාභ.

(2) අනාගත වෙළෙඳපොළ තේරුම් ගැනීමට නොහැකි වීම නිසා සිදුවන හානි.

(3) හදිසි අනතුරු නිසා ඇතිවිය හැකි අවදානම.

(4) කළමනාකරුවන්ගේ තීරණ නිසා සිදුවන අලාභ.

**1.5** හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධනය සඳහා දායක වන නමුත්, කළමනාකරණ කටයුතුවලට සහභාගී **නොවන** හවුල්කරු හඳුන්වනු ලබන්නේ:

(1) සීමිත හවුල්කරු ලෙසයි.  (2) ක්‍රියාකාරී හවුල්කරු ලෙසයි.

(3) සාමාන්‍ය හවුල්කරු ලෙසයි.  (4) නාමමාත්‍ර හවුල්කරු ලෙසයි.

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, පිටසන් (endorsement) වර්ගයක් ලෙස සලකනු **නොලබන්නේ** කුමක් ද?

(1) හිස් පිටසන.  (2) සීමාකාරී පිටසන.

(3) විශේෂ පිටසන.  (4) කොන්දේසි රහිත පිටසන.

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, ප්‍රාග්ධන වෙළෙඳපොළේ භාවිත වන උපකරණයක් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) සාමාන්‍ය කොටස්.  (2) වාණිජ පත්‍රිකා.

(3) භාණ්ඩාගාර බිල්පත්.  (4) චෙක්පත්.

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යවසායකයෙකු සතු ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) නව ව්‍යාපාරික අවස්ථා පිළිබඳ නැඹුරුව.  (2) නම්‍යශීලී නොවීම.

(3) නවෝත්පාදනය හා නිර්මාණශීලීත්වය.  (4) අවදානම් කළමනාකරණය කිරීමේ හැකියාව.

**1.9** පහත ප්‍රකාශන සලකා බලන්න:

**(a)** සේවක කුසලතා අවතක්සේරු කිරීම.

**(b)** ව්‍යාපාරික රහස් සොරාගැනීම.

**(c)** දුරකතන සංවාදවලට රහසිගතව සවන් දීම.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරික ආචාරධර්ම උල්ලංඝණය වන අවස්ථා වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි.  (2) **(a)** සහ **(c)** පමණි.

(3) **(b)** සහ **(c)** පමණි.  (4) ඉහත සඳහන් සියල්ලම.

1.10 පහත සඳහන් ඒවා අතුරෙන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථකවීමට දායකවන අභ්‍යන්තර සාධකයක් වන්නේ කුමක් ද?

(1) බැංකුවලින් මුල්‍ය පහසුකම් ලබාගැනීමට ඇති නොහැකියාව.

(2) ප්‍රධාන සැපයුම්කරුවෙකු බංකොලොත් වීම.

(3) කළමනාකරණ කුසලතා සහ තීක්ෂණ බුද්ධිය අඩු වීම.

(4) රාජ්‍ය ප්‍රතිපත්තිවල සිදුවන වෙනස්වීම්.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය* ***සත්‍ය*** *හෝ* ***අසත්‍යදැයි*** *දක්වන්න.* ***සත්‍ය*** *හෝ* ***අසත්‍ය*** *යන උත්තරය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 සංවිධානයන්ට ඔවුන්ගේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අසීමිත සම්පත් ප්‍රමාණයක් පවතී.

1.12 බලපත්‍රලාභී වාණිජ බැංකු, තත්කාලීන දළ පියවීම් පද්ධතියක (Real Time Gross Settlement System) සහභාගිකරුවෙකු වේ.

1.13 හරිත ව්‍යවසායකත්වය, ව්‍යවසායකත්වයේ ප්‍රධාන ප්‍රවණතාවයක් වේ.

1.14 චෙක්පතක සාමාන්‍ය රේඛණයක් අණලද්දාට සිදුකළ හැකිය.

1.15 සීමාසහිත පෞද්ගලික සමාගමකට මහජනතාව වෙත කොටස් නිකුත් කළ හැකිය.

*අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.16 මුදල් වෙළෙඳපොළ සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ අතර වෙනස්කම් දෙකක්(02) සඳහන් කරන්න.

1.17 චෙක්පතක් ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක්(02) සඳහන් කරන්න.

1.18 විධිමත් සංවිධානයක් සහ අවිධිමත් සංවිධානයක් අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

1.19 ව්‍යවසායකත්වයේ සමාජ සහ ආර්ථික ප්‍රතිලාභ දෙකක්(02) සඳහන් කරන්න.

1.20 ශ්‍රී ලංකාවේ කාන්තා ව්‍යවසායකත්වයේ පිබිදීමක් ඇතිවීමට දායක වූ සාධක දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

**චින්තක** සහ **කිත්මිණ** වෘත්තියෙන් ගෘහ නිර්මාණ ශිල්පීන් වෙති. සමානව ප්‍රාග්ධනය යොදමින් විසිතුරු භාණ්ඩ අලෙවිසැලක් ආරම්භ කිරීමට ඔවුන් දෙදෙනා අදහස් කොට ඇත. **චින්තක** ඔවුන්ගේ ව්‍යාපාරය සීමිත පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට අදහස් කරන නමුත්, **කිත්මිණ** ඒ සඳහා කැමත්තක් නොදක්වයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සීමාසහිත පෞද්ගලික සමාගමක් හැරුණු විට **චින්තක** සහ **කිත්මිණ** ට ඔවුන්ගේ ව්‍යාපාරය ආරම්භ කිරීම පිණිස සලකා බැලිය හැකි වෙනත් ව්‍යාපාර සංවිධාන වර්ගයක් **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) ඉහත (a) හි සඳහන් කළ ව්‍යාපාර සංවිධාන වර්ගයේ ලක්ෂණ (features) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(c) ඉහත (a) හි සඳහන් ව්‍යාපාර සංවිධානයෙහි ඇති අවාසි දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## **03** වන ප්‍රශ්නය

**ජයනන්ද,** කළුතර ප්‍රදේශයේ වානේ නිෂ්පාදන වැඩපලක් පවත්වාගෙන යනු ලබන අතර, පාරිභෝගික ඇණවුම් සඳහා අවශ්‍ය වානේ ඔහු විසින් කොළඹින් මිලදී ගනු ලැබේ. සාමාන්‍යයෙන් වානේ සැපයුම්කරුවන්ට **ජයනන්ද** මුදලින් ගෙවීම් සිදුකරනු ලැබේ. ඔහු විසින් ප්‍රධාන පෙළේ වාණිජ බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන යනු ලබන අතර, ඔහු විසින් පසුදාතම (post-dated) චෙක්පත් සහ විවෘත (open) චෙක්පත් සමහර වානේ සැපයුම්කරුවන්ට නිකුත් කරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ව්‍යාපාර සංවිධානයකට මුදල් වැදගත් වන්නේ ඇයිද යන්නට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න** (ලකුණු 04)

(b) ජංගම ගිණුම් හිමියෙකුට ඇති ප්‍රතිලාභ (benefits) තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(c) "මතුදාතම (post-dated) චෙක්පතක්" සහ "විවෘත (open) චෙක්පතක්" අතර ඇති වෙනස **පැහැදිලි කරන්න.**
(ලකුණු 03)
(මුළු ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**සීමාසහිත ගිගර් සමාගම,** පොල් නිෂ්පාදනයේ අතුරු නිෂ්පාදිතයක් වන පොල් ලෙලි (coconut husk) භාවිත කරමින් ප්‍රධාන වශයෙන් අපනයන වෙළෙඳපොළ සඳහා මල් බඳුන් නිපදවනු ලබයි. මෙම ව්‍යාපාරය ආරම්භයේදී, නිෂ්පාදන ක්‍රියාවලින්, සම්පූර්ණයෙන්ම හස්ත කර්මාන්තයක් ලෙස සිදුකරන ලදි. කෙසේවෙතත්, කාලයත් සමඟ ඇතැම් ක්‍රියාවලින්, යන්ත්‍ර භාවිතයෙන් සිදුකරන ක්‍රියාවලින් බවට පරිවර්තනය කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අන්තර්ජාතික වෙළඳාමට පිවිසීමට ඇති ප්‍රධාන හේතු තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) **සීමාසහිත ගිගර් සමාගමට** ඔවුන්ගේ ව්‍යාපාර මෙහෙයුම් සිදුකිරීමේදී රජය විසින් සහාය වන ක්‍රම දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) **සීමාසහිත ගිගර් සමාගමට**, රටේ සංවර්ධනය සඳහා දායක විය හැකි ආකාර දෙකක්(02) **පැහැදිලි කරන්න**.
(ලකුණු 03)
(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

**කේක් සහ බේක්** යනු කේක් සහ අනෙකුත් බේකරි අයිතම නිෂ්පාදනය කොට විකිණීමේ යෙදෙන කේක් අලෙවි සැලක් වන අතර, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක තුළ එහි ශාඛාවන් 14 ක් පිහිටා ඇත. අන්තර්ජාල ඇණවුම් සහ බෙදාහැරීමේ පහසුකම් නිසා **කේක් සහ බේක්** ආයතනය පාරිභෝගිකයන් අතර ජනප්‍රියව පවතී. **කේක් සහ බේක්** ආයතනය එහි සියලුම ප්‍රවාහන අවශ්‍යතා බාහිර මූලාශ්‍රගතකරණය සිදුකර ඇත. එබැවින් එම ආයතනයේ අමුද්‍රව්‍ය සහ නිමි භාණ්ඩවල ස්වභාවය අනුව බාහිර ප්‍රවාහන සේවා සපයන්නෙකු තෝරාගැනීම, ආයතනයට ඉතාමත් තීරණාත්මක සාධකයකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) හොඳ ප්‍රවාහන පද්ධතියක් භාවිත කිරීමෙන් **කේක් සහ බේක්** ආයතනයට ලබාගත හැකි වාසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) ප්‍රවාහන පද්ධතියක මූලිකාංග (elements) තුනක්(03), උදාහරණයක් බැගින් දක්වමින් **හඳුනා දක්වන්න**.(ලකුණු 03)

(c) විද්‍යුත් වෙළඳාමේ ජනප්‍රියතාවයට හේතු හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)
(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**රිචී කුකීස්** යනු ශ්‍රී ලංකාවේ ජනප්‍රිය බිස්කට් සන්නාමයක් වන අතර, **රිචඩ් මුදලිගේ** විසින් 1970 දශකයේදී පවුලේ ව්‍යාපාරයක් ලෙස බිස්කට් නිෂ්පාදනය ආරම්භ කරන ලදී. **රිචඩ් මුදලිගේ** මහතාගේ බිරිඳ වන **රේණුකා මුදලිගේ** මහත්මිය බිස්කට් වට්ටෝරුවල (recipes) හිමිකාරිත්වය දරණු ලබන අතර, ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට සහ මිතුරන්ට බිස්කට් පිළියෙල කිරීම ඇයගේ විනෝදාශය විය. **රේණුකා මුදලිගේ** මහත්මියගේ බිස්කට්වල ඇති අධික රසවත් බව නිසා ඔවුන්ගේ මිතුරන් විසින් මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට ඔවුන්ව දිරිමත් කරන ලදි. එම දිරිගැන්වීම හේතුකොටගෙන ඔවුන් එකල පැවති මහා පරිමාණ හෝටල් ඉලක්ක කර ගනිමින් කුකීස් ව්‍යාපාරය ආරම්භ කරන ලදී. බිස්කට් සන්නාමය පිළිබඳ ධනාත්මක අදහස් පාරිභෝගිකයන්ගෙන් ආයතනය වෙත ලැබේ.

පසුගිය දශක කිහිපය තුළ, මෙම ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ජනප්‍රිය බිස්කට් සන්නාමයක් ලෙස විකාශනය විය.කෙසේවුවද, මෙම විකාශනයේදී ව්‍යාපාරික පරිසරයේ පැවති වෙනස්වීම් හමුවේ ඉහළ පහළ යැම්වලට භාජනය වීමට ආයතනයට සිදුවිය. විවෘත ආර්ථිකය හඳුන්වාදීම, සිවිල් යුද්ධය නිසා හටගත් ගැටළු, දේශපාලන අස්ථාවරත්වය හා රාජ්‍ය ප්‍රතිපත්තිවල සිදුව ඇති වෙනස්කම්, ගෝලීය ආර්ථිකයේ බලපෑම, බිස්කට් පරිභෝජනය පිළිබඳ ජනතාවගේ ආකල්ප හා කැමැත්තෙහි සිදුවූ වෙනස්කම් ආදිය පසුගිය දශක පහ තුළ ඔවුන් මුහුණ දුන් බාහිර ගැටළු කිහිපයකි. මෑතක සිට ඔවුන් ව්‍යාපාරයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීමේ දුෂ්කරතාවයකට මුහුණ දෙමින් සිටී. මෙම නිෂ්පාදිත සඳහා භාවිත කරන බොහෝ ද්‍රව්‍ය, ආනයනික අයිතමයන් වන අතර, ඩොලර් අර්බුදය හේතුවෙන් වෙළෙඳපොලේ අමුද්‍රව්‍යවල හිඟයක් පවතී.

තවද, **රිචඩ් මුදලිගේට** සහ **රේණුකා මුදලිගේට** ඔවුන්ගේ ව්‍යාපාර බලා ගැනීම සඳහා ඔවුන්ගේම දරුවෙකු නොමැති අතර, ඔවුන් ඉතා දක්ෂ සීමිත සේවක පිරිසක් සමඟින් ව්‍යාපාර කටයුතු කළමනාකරණය කරනු ලබයි.

මේ වනවිට, **රිචඩ් මුදලිගේ** සහ **රේණුකා මුදලිගේ** වයස අවුරුදු 80 ගණන්වල පසුවන අතර, ඔවුන්ට තම ව්‍යාපාරය භාර දීමට උරුමක්කාරයෙකු නොමැති නිසා ව්‍යාපාරය විකිණීමට ගැනුම්කරුවෙකු සොයමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **රිචී කුකීස්** ආයතනයේ අභ්‍යන්තර සහ බාහිර ව්‍යාපාරික පරිසරය **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) අනාගත ගැනුම්කරුවෙකු (ආයෝජකයෙකු) විසින් සලකා බැලිය යුතු **රිචී කුකීස්** ආයතනයේ ව්‍යාපාරික පරිසරය ශඳුඅත (SWOT) විශ්ලේෂණය භාවිතයෙන් **තක්සේරු කරන්න**. (ලකුණු 06)

(c) **රිචී කුකීස්** ආයතනය සිය බෙදාහැරීමේ මාධ්‍යය පිළිබඳව සලකා බැලිය යුතු සාධක තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(d) ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් (SMEs) මුහුණපාන අභියෝග තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(e) පාරිසරික තිරසාරත්වය (environmental sustainability) ළඟා කර ගැනීමට **රිචී කුකීස්** ආයතනයට සහාය විය හැකි ආකාර (ways) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැළකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |